ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு
Press Complaints Commission of Sri Lanka

e-Newsletter

Vol 02: No: 05 - June 2012

Website: www.pccsl.lk
E-mail: pccsl@pccsl.lk
Tel: +94 115 353635
Fax: +94 115 335500

# තෙවන පාර්ශ්වීය පැමිණිලිකරුවන්ට පහසුවන ලෙස ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ කාර්ය පටිපාටිය යාවත්කාලීන කරයි

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට පසුගිය මාස හයක කාලය තුළ ලැබුණු වළංගු පැමිණිලි 58 න් පැමිණිලි 23 කට විසඳුම් ලබා දී තිබේ. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 39.70 කි.

මෙම වසරේ ජනවාරි සිට ජූනි මස වනවිට පසුගිය මාස හයක කාලයක් තුළ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 86කි.(ලැබුණු පැමිණිලි සංඛ්‍යාව - සිංහල මාධ්‍යය - 34, දෙමළ මාධ්‍යය - 27, ඉංග්‍රීසි මාධ්‍ය -14) සහ (මුද්‍රිත මාධ්‍ය නොවන පැමිණිලි සංඛ්‍යාව 11) පසුගිය මාස හයක කාලය තුළ පැමිණිලිකරුවන් සෘජුවම පුවත්පත් සමඟ කටයුතු කර විසඳාගෙන ඇති පැමිණිලි සංඛ්‍යාව 201 කි. ඒ අතර සිංහල මාධ්‍යයට අදාළ පැමිණිලි 158 ක් දෙමළ මාධ්‍යයට අදාළ පැමිණිලි 05 ක් සහ ඉංග්‍රීසි මාධ්‍යයට අදාළ පැමිණිලි 38 ක් වේ.

තැපැල් මගින් විද්‍යුත් තැපැල මගින් සහ ෆැක්ස් මගින් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පැමිණිලිකරුවන්ට අවස්ථාව සලසා දී ඇත. මුද්‍රිත මාධ්‍ය ජනමාධ්‍යවේදීන් පිළිගෙන ඇති වෘත්තීය ආචාරධර්ම මාලාව උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි, පැමිණිලිකරුවන් සෑහීමට පත්වන පරිදි මසක් තුළ දී විසඳලීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම උත්සාහ කරයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ කාර්ය පටිපාටියට අනුව මුලින්ම සමථකරණය, මැදිහත්කරණය ඔස්සේ පැමිණිලි විසඳීමේ හැකියාව අනුව කටයුතු කරයි. අවශ්‍යවන්නේනම් බේරුම්කරණය අවසන් පියවර වේ. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වේගවත්ව සහ සාධාරණව සියලුම පැමිණිලි සහයෝගයෙන් විසඳගන්නා බැවින් බේරුම්කරණය කරා යාමට අවශ්‍යතාවයක් ඇති නොවෙයි.

කෙසේ වුවද ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පසුගිය නව වසරක කාලයකට වඩා තෙවන පාර්ශ්වීය පැමිණිලිකරුවන්ට පහසුවන ලෙස සිය රීති සහ කාර්ය පටිපාටිය යාවත්කාලීන කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ කාර්ය පටිපාටියට අනුව තෙවැනි පාර්ශවීය පැමිණිලි සඳහා මෙතෙක් කල් ඉඩ සැලසුණේ පැමිණිලිවල අදාළත්වය වෙන් වෙන්ව සලකා බැලීමේ පදනම මතය. එසේ කරන ලද්දේ පුවත්පත්වලට එරෙහිව තෙවැනි පාර්ශවීය පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙතැයි යන හේතුවෙනි.

03වන පිටුවට

# ලෙව්සන් නඩු විභාගයට ඩවුනිං වීදියෙන් පැමිණි දා-----------

මෙම නඩුව විභාග වනවිට එය සිත් ඇදගන්නාසුළු ප්‍රසාංගික රූපවාහිනී නාට්‍යයක් මෙන් දිගහැරෙන්නට විය. බ්‍රිතාන්‍ය දේශපාලකයන් ජනමාධ්‍යවේදීන් සමඟ සුහදශීලී වූ ආකාරය සොයා යාමේ ක්‍රියාවලිය නව මගක් ගෙන තිබුණි. - නූපූර් බාසු ලන්ඩනයේ සිට

2011 නොවැම්බර් 14 වෙනිදා සිට බ්‍රිතාන්‍ය රාජකීය උසාවිය තුළ පැවැත්වුණු ලෙව්සන් නඩු විභාගය ඉදිරියේ එදින බ්‍රිතාන්‍ය අගමැතිවරයා පෙනී සිටියේය. ලෝකයේ ඉතා බලවත් පුද්ගලයින් තියුණු ප්‍රශ්න කිරීම්වලට ලක් කිරීමට ප්‍රසිද්ධ අයෙකු වූ රාජකීය නීතිඥ රොබට් ජේ එදින පැය හතක පමණ කාලයක් කැමරොන්ගෙන් ඉතා දැඩි ලෙස ප්‍රශ්න කරන ලදි. ඔහුගේ ප්‍රශ්න කිරීම් අවසන් වනතුරුම ජේ, අගමැතිවරයා ඇමතුවේ 'කැමරොන් මහතාණෙනි' කියා මිස 'අගමැතිතුමනි' කියා නොවේ.

ලෙව්සන් නඩු විභාගයේ සාක්ෂි දීම සඳහා දනට සිටින අගමැතිවරයා මෙන්ම හිටපු අගමැතිවරුන් තිදෙනෙකු වන ජෝන් මේජර්, ටෝනි බ්ලෙයාර් සහ ගෝර්ඩන් බ්‍රවුන් ද කැඳවා තිබේ. මෙම නඩු විභාගය ආරම්භ කරන ලද්දේ පසුගිය වසරේ දී සිදු වූ රූපට් මර්ඩොක්ට හිමි 'නිවුස් ඉන්ටර්නැෂනල්' මගින් කරන ලද දුරකථනවලට අනවසරයෙන් සවන් දීමේ සිද්ධිය අනාවරණය වීම නිසා ඇතිවූ මහජන උද්ඝෝෂණයෙන් පසුවය. 2011 ජූලි මස 06 දින කැමරොන් පාර්ලිමේන්තුවේ දී පවසා සිටියේ විනිශ්චයකාර ලෙව්සන් සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් නඩු විභාගය පවත්වන බවයි. එමගින් අනවසරයෙන් දුරකථනයන්ට සවන් දීමේ සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සිදු වූ මිලී ඩවුලර් තරුණිය මරා දැමීමේ සිද්ධිය ( 'නිවුස් ඔෆ් ද වර්ල්ඩ්' ඇයගේ දුරකථනයට ද අනවසරයෙන් සවන් දී ඇත ) සහ මර්ඩොක් මාධ්‍ය ආයතනය මගින් නීති විරෝධී ලෙස පොලීසයට මුදල් ගෙවා ඇතැයි යන චෝදනාව ද තව දුරටත් විමර්ෂණය කිරීම සිදු කරයි. තමා තම පක්ෂයේ අදහස් ප්‍රසිද්ධ කිරීම සඳහා ඉහළ පෙළේ පුවත්පත් කර්තෘවරුන් සහ ජනමාධ්‍යවේදීන් සමඟ 1404 වතාවක් 2005 වසරේ සිට රැස්වීම්වලට සහභාගි වූ බව බ්‍රිතාන්‍ය අගමැතිවරයා පිළිගත්තේය. එවිට රාජකීය නීතිඥවරයා එක්වරම ප්‍රකාශ කළේ මසකට රැස්වීම් 26 ක් පමණ පවත්වා ඇති බව මෙයින් පෙනෙන බවයි. මේ සම්බන්ධයෙන් කැමරොන් පවසා සිටියේ එතෙක් නව ලේබර් පක්ෂයට ලැබී තිබූ ප්‍රසිද්ධිය නැවත කොන්සර්වේටිව් පක්ෂයට ලබා ගැනීම සඳහා ඔහුට දැඩි වෙහෙසක්

04වන පිටුවට

## ඇතුළු පිටු

* තොරතුරු දැනගැනීමේ අයිතිය යනු කුමක්ද ? පිටුව 02
* ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ජූනි මස ක්‍රියාකාරකම් පිටුව 03
* ලිව්සන් නඩු විභාගයට ඩවුනින් වීදියෙන් පැමිණි දා - පිටුව 04

# තොරතුරු දැනගැනීමේ අයිතිය යනු කුමක්ද ?

**තොරතුරු දැනගැනීමේ අයිතිය වැදගත්වන්නේ ඇයි?**
තොරතුරු යනු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ ඔක්සිජන් වායුව වේ. සිය සමාජයේ සිදුවෙමින් පවතින්නේ කුමක්දැයි මහජනතාව දන්නේද, සිය සමාජයේ සිදුවන කටයුතු පිළිබඳ නීති මගින් සගවන්නේනම් ඔවුන්ට එම සමාජයේ අර්ථපූර්ණ කොටස්කරුවන් විය නොහැක. එබැවින් තොරතුරු දැනගැනීමට ජනතාවට ඉඩ සලසා දීම යහ පාලනයේ අත්‍යාවශ්‍ය කොටසකි.

**ආර් ටී අයි යනු කුමක්ද ?**
ආර් ටී අයි යන්නේ තේරුම නම් තොරතුරු දැනගැනීමේ අයිතිය යන්නයි.
සෑම පුරවැසියෙකුම නොයෙක් කටයුතු සඳහා බදු මුදල් ගෙවන බැවින් එම මුදල්වලට සිදුවන්නේ කුමක්දැයි දැනගැනීමට අයිතියක් ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය අනුව රජයේ මෙන්ම වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයන් හි වියදම්, නොයෙක් වැඩසටහන් සහ ව්‍යාපෘතිවල කටයුතු සම්බන්ධයෙන් විස්තර ලබාගැනීමේ අයිතිය හිමිවෙයි. ව්‍යාපෘතියේ ප්‍රතිඵලය සහ වැයවූ මුදල පිළිබඳ දැනගැනීමට ජනතාවට අයිතිය ලැබෙයි.

**අපට මෙම අයිතිය ලබාදීම සඳහා පනතක් අවශ්‍යවන්නේ ඇයි?**
ඔබගේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පළාත්පාලන ආයතනය (ප්‍රාදේශීය සභාව, නගර සභාව හෝ මහ නගර සභාව) කොපමණ මුදලක් අනුමත කළේද? සැපයුම්කරුවන් කවුරුන්ද වැයවූ මුදල කොපමණද කොන්ත්‍රාත්කරු කවුරුන්ද ආදී වශයෙන් තොරතුරු විමසා දැනගැනීමට ඔබට හැකියාවක් නොමැත. එබැවින් අපට එම අයිතිය භුක්තිවිඳීම සඳහා ක්‍රමවේදයක් හෝ යාන්ත්‍රණයක් අවශ්‍යව ඇත. පනතක් අවශ්‍යවන්නේ ඒ සඳහාය.

**තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර තිබේද?**
එක්සත් ජාතික පෙරමුණ බලයේ සිටි 2001 - 2003 වසර කාලය තුළ දී ශ්‍රී ලංකා පුවත්පත් ආසතනයේ සහ ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ මගපෙන්වීම යටතේ ජනමාධ්‍ය පිළිබඳ විශේෂඥයින්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු නියෝජිතයින්, සහ අධිකරණ අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත නීතිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මගින් 'තොරතුරු දැනගැනීමේ අයිතිය කෙටුම්පත' සම්පාදනය විය. එය 2003 වසරේ දී කැබිනට් මණ්ඩලයේ අනුමතව ඇත. පාර්ලිමේන්තු මැතිවරණයට යාමේ හේතුවෙන් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකෙරුණි.

- 2010 වසර මුල් කාලයේ දී, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ හිටපු අධිකරණ ඇමති මිලින්ද මොරගොඩ මහතා 2003 වසරේ කෙටුම්පත සමාලෝචනය කර සකස් කිරීමට පෙරමුණ ගත්තද එයද පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවුණි.
- 2003 ජනවාරි මස කැබිනට් මණ්ඩලය අනුමත කළ කෙටුම්පත මත පදනම් වූ පුද්ගල මන්ත්‍රී යෝජනාවක් ලෙස විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා 2010 වසරේ දී තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වූ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. විපක්ෂ නායකවරයාට පුද්ගල මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකිය යන පදනම මත පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා එයට විරෝධය පෑවේය.
- ඉන් අනතුරුව එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක කරූ ජයසූරිය මහතා විපක්ෂ නායකවරයාගේ අනුදැනුම යටතේ පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස මෙම පනත් කෙටුම්පත 2010 වසරේ සැප්තැම්බර් 23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වූ පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය කටයුතු කරමින් සිටින බව පාර්ලිමේන්තුවේ ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක දිනේෂ් ගුණවර්ධන මහතා ඒ මොහොතේ දී පාර්ලිමේන්තුවට දැනුම්දුන්නේය. තවද ඉදිරි මාස හයක කාලය තුළදී එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ඒ මහතා එහිදී පැවසීය. ඉන් අනතුරුව ඇතිවූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් කරූ ජයසූරිය මහතා විසින් එම පුද්ගල මන්ත්‍රී යෝජනාව ඉවත්කරගන්නා ලදි.
- එක්සත් ජාතික පක්ෂය, නැවතත් මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව කථානායකවරයා පාර්ලිමෙන්තුවට දැනුම්දීමෙන් පසු කරූ ජයසූරිය මහතා විසින් 2011 ජූනි මස 21 දින එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. රජය ඒ පිළිබඳ විවාදයකට එකඟ වුවද ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේය. ඒ සඳහා ලැබුණේ ඡන්ද 32 ක් පමණි. ඊට එරෙහිව ඡන්ද 99 ක් ලැබීමෙන් එම පනත් කෙටුම්පත පාර්ලිමෙන්තුවේ පරාජයට පත්විය.

**උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම ආර් ටී අයි ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම නිර්දේශ කර තිබේද?**
ඔව්, තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වූ පනතක් ගෙනඒමට තිබෙන අවශ්‍යතාවය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් දැඩිව අවධාරණය කර ඇත.

**තොරතුරු දැනතැනීමේ අයිතිය නීතියක් වශයෙන් පිළිගත් දකුණු ආසියානු රටවල් තිබේද ? ඒ කවරේද ?**
ඔව්, පකිස්ථානය, ඉන්දියාව, නේපාලය සහ බංගලිදේශය යන රටවල් එය නීතියක් වශයෙන් පිළිගෙන තිබේ. ශ්‍රී ලංකාව, මාලදිවයින සහ භූතානය එය තවමත් නීතියක් වශයෙන් පිළිගෙන නොමැත.

**තොරතුරු දැනගැනීමේ අයිතිය අදාළවන ක්ශේත්‍ර කවරේද ?**
- රජයේ නිලධාරීන් ඇතුළු සියලුම රජයේ ආයතන,
- රජයේ ඇමතිවරු
- ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති සියලූම ආයතන සහ පුද්ගලයින්
- රජයේ දෙපාර්තමේන්තු
- සංස්ථා
- උසස් අධ්‍යාපන ආයතන
- 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සියලූම සමාගම් සහ ව්‍යවස්ථාපිත ආයතන. රජයේ මෙන්ම වෙනත් මහජන ආයතන මේ සඳහා අයත් වේ.
- පළාත්පාලන ආයතන
- මහජන සේවා සපයන සියලුම ආයතන සහ සංවිධාන
- පළාත් සභා විසින් පිහිටුවා ඇති සියලුම දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන.

**තොරතුරු දැනගැනීමේ පනතට අදාළ තොරතුරු ඔබට ලබාගතහැක්කේ කොහෙන්ද ?**
ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙන් ලබාගත හැක.

# තෙවන පාර්ශ්වීය පැමිණිලිකරුවන්ට පහසුවන ලෙස (1වන පිටුවේ)

හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ මාධ්‍ය නිලධාරියා, අවස්ථාවකදී ඇය වෙනුවෙන් ඇයගේ දරුවන් සම්බන්ධව පුවත්පතකට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ විෂය පථය පුළුල් කිරීමට සහ හිටපු ඔම්බුඩ්ස්මන්වරයෙකු හා පාර්ලිමේන්තු මහ ලේකම්වරයෙකු වූ සැම් විජේසිංහ මහතා ප්‍රධානත්වය දරන ආරවුල් නිරාකරණ මණ්ඩලය තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලීම ආරම්භ කිරීමට සුදුසු කාලය පැමිණ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ හැඟීම වේ. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් ලේකම් කාර්යාලය සහ ආරවුල් නිරාකරණ මණ්ඩලය එවන් තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බලනුයේ එහි ඇති අදාළත්වය අනුවය. ඒ අනුව නියමිත අංශ යටතේ ලැබෙන තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලෙනු ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව පහත දැක්වෙන අංශ යටතේ ලැබෙන තෙවැනි පාර්ශවීය පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමේ හැකියාව ඇත.

- පාරිසරික කණ්ඩායම්
- සත්ව සුබසාධක කණ්ඩායම්
- කුඩා දරුවන් වෙනුවෙන් වැඩිහිටියන්ගෙන්
- අනතුරකට භාජනය වුවෙකුගේ සමීපතම ඥාතියෙකුගෙන්
- සිරගත වූ අයෙකුගේ සමීපතම ඥාතියෙකුගෙන්
- පෞද්ගලිකව හානියක් වී ඇති පුද්ගලයෙකුගෙන් ලබා ගත් අවසරය මත ඔහු වෙනුවෙන් කරන වෙනත් අයෙකුගේ පැමිණිල්ලක්

ස්වයං නියාමන යාන්ත්‍රණය මඟින් මාධ්‍ය හසුරුවන බ්‍රිතාන්‍ය, ජර්මනිය, බොහෝ ස්කැන්ඩිනේවියානු රටවල්, බොස්නියා, හර්සගොවිනා ඇතුළු ලෝකයේ බොහෝ රටවල් තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බලයි.

## ජූනි මස ක්‍රියාකාරකම් - ඡායාරූප විස්තර



වෘත්තීය ආචාර ධර්ම සහ ස්වයං නියාමනයේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් කැන්ඩි නිවුස් පුවත්පතේ කර්තෘ මණ්ඩලය සමඟ මහනුවර එම පුවත්පත් කාර්යාලයේ දී පැවති සාකච්ඡාවේ අවස්ථාවක්.



කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යාපනය විෂය හදාරණ සිසුවියන් සඳහා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පැවැත්වූ සම්මන්ත්‍රණයේ එක් අවස්ථාවක්.



එම සම්මන්ත්‍රණයේ දී සිසුවියක් ප්‍රශ්නයක් අසන අයුරු.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂමණ්ඩලය**
කුමාර් නඩේසන් මහතා (සභාපති), නිමල් වෙල්ගම මහතා, සිංහ රත්නතුංග මහතා, මනික් ද සිල්වා මහතා, එන්. එම්. අමීන් මහතා, සීතා රංජනී මෙනවිය, සිරි රණසිංහ මහතා, සුන්දර නිහතමානි ද මැල් මහතා, ඥානසිරි කොත්තිගොඩ මහතා, මහාචාර්ය අජන්තා හපුආරච්චි.

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය**
සුකුමාර් රොක්වුඩ් මහතා - ප්‍රධාන විධායක නිලධාරී සහ ඉංග්‍රීසි පැමිණිලි නිලධාරී, අමීන් හුසේන් මහතා - දෙමළ පැමිණි නිලධාරී, කමල් ලියනආරච්චි - සිංහල පැමිණිලි නිලධාරී සහ ප්‍රවර්ධන නිලධාරී.

# ලෙව්සන් නඩු විභාගයට ඩවුනිං වීදියෙන් පැමිණි දා (1වන පිටුවෙන්-----)

දුරීමට සිදු වූ බවයි. ' ඔරලෝසුවේ බට්ටා අනෙක් පැත්තට දෝලනය වී තිබූ බැවින් අපට එය නැවත අපගේ පැත්තට ගැනීමට සිදු විය.' නමුත් කැමරොන් ලජ්ජාවට පත්වූයේ ඔහු මර්ඩොක් අධිරාජ්‍ය සමග පැවැත්වූ සමීප සබඳතා විශේෂයෙන්ම නිවුස් ඉන්ටර්නැෂනල් ආයතනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිණී රෙබෙකා බෘක් සමග පැවැත්වූ සමීප සබඳතා මහජනතාවට හෙළිවීම නිසාය. දැනට ඇයට හා ඇගේ සැමියාට එරෙහිව දුරකථනවලට හොරෙන් සවන් දීමේ සිද්ධියට අදාළව නඩුවක් බ්‍රිතාන්‍ය අධිකරණයේ විභාග වේ. මෙම හෙළිදරව්වට හේතු වූයේ 1999 කොන්සර්වේටිව් පක්ෂ සම්මේලනයට පෙර දින බෘක් විසින් කැමරොන් වෙත එවන ලද හදිසි ඊ මේල් පණිවුඩයක් නිසාය. 'මම හෙට ඔබ වෙනුවෙන් සහයෝගය ලබා දෙන්නෙමි. එසේ කරනුයේ හොඳ මිතුරෙක් නිසා පමණක් නොව වෘත්තීයමය වශයෙන් ඒකාන්තයෙන්ම අප මෙහි එකට සිටින බැවිනි. ඔබගේ ජීවිත කාලයේ කතාව ? ඔව්, කැම්. චැනල් 4 හි මාධ්‍යවේදියෙක් මෙය හැඳින්වූයේ මහජනතාව පාවාදීමක් ලෙසය. 'අප මෙහි එකට සිටින බැවිනි' සමහරුන් හිතන්නට ඇත්තේ මහ ජනතාව අමතා කියූ දෙයක් ලෙසය. එය මාධ්‍ය හිමිකරුවන් අමතා කියූ දෙයක් ලෙස ඔවුන් නොසිතන්නට ඇත.

මෙහිදී කැමරොන් දැඩි ප්‍රශ්න කිරීම්වලට ලක්වූ අතර බෘක් සමග ඔහුගේ තිබූ සබඳතා පමණක් නොව, රූපට් මර්ඩොක් හමුවීම ( ඔහුව 10 වතාවක් හමුවී ඇත ) සහ ඔහුගේ පුත් ජේම්ස් මර්ඩොක් හමුවීම ( ඔහුව 15 වතාවක් හමුවී ඇත ) පිළිබඳව එහිදී විමසා ඇත. බ්‍රිතාන්‍ය පවුම් බිලියන් 8 ක 'බී ස්කයි බී' ලංසුව පිළිබඳව බැලීමට සංස්කෘතික ලේකම් ජෙරමි හන්ට් පත් කිරීම ඇමතිවරයා ලෙස සාධාරණීකරනය කරන්නේ කෙසේද යන වග ඔහුගෙන් නැවත නැවතත් ප්‍රශ්න කරන ලදි. හන්ට් පැහැදිලිවම මර්ඩොක් ගේ ලංසුවට සහයෝගය දක්වන ලද අතර මැදිහත් ලෙස ක්‍රියා කර නැත. ලෙව්සන් නඩු විභාගයේ දී කැමරොන්, හන්ට් මෙම සිද්ධියේ දී තීරණාත්මක සාධකයක් වන බව තමන්ට පෙනෙන්නේ නැතැයි එය ප්‍රතික්ශේප කර සිටියේය.



ඩේවිඩ් කැමරොන්

මෙම මස මුලදී මෙම නඩු විභාගයේ දී ජෙරමි හන්ට් විසින් දෙන ලද කට උත්තරය නිසා සාක්ෂි විමසීමේ ක්‍රියාවලිය වෙනත් මට්ටමකට පිවිසියේය. කැබිනට් අමාත්‍යවරයකුගේ කෙටි පණිවුඩ සිය ගණනක් මහජනයාට දැකගැනීමට ප්‍රදර්ශනය කෙරිණ. මෙමගින් හෙළි වූයේ ෆ්‍රෙඩ් මිෂෙල් නමැත්තා මර්ඩොක් අධිරාජ්‍ය වෙනුවෙන් බලපෑම් කිරීමට කෙටි පණිවුඩ 542 ක් හන්ට් ගේ විශේෂ උපදේශකයා වන ස්මිත් මහතා (දැනට රැකියාවෙන් පහ කර ඇති) වෙත යවා ඇති බවත්, තවත් කෙටි පණිවුඩ 35 ක් සහ දුරකථන ඇමතුම් 140 ක් හන්ට් මහතාට ද ලබා දී ඇති බවයි. ' සමාගමක් ලෙස ඔවුන්ට සියල්ල ආලෝකයේ වේගයෙන් අවශ්‍ය වුණා' යයි හන්ට් මේ සම්බන්ධයෙන් පවසා සිටියේය.

ජෙරමි හන්ට් තවමත් රාජකාරියේ යෙදී සිටීමත්, කැමරොන් ඔහුව ආරක්ෂා කිරීමත් ඔවුන්ගේ සහාග රජයේ පාර්ශවකරු වන ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයට දේශපාලනික වශයෙන් විශාල ගැටලුවක් බවට පත්ව ඇත. කැමරොන් නඩු විභාගයට පැමිණීමට පෙර දින හන්ට් ප්‍රශ්නය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී පැවැත්වුණු ඡන්ද විමසීමේදී ඔවුන් ඡන්ද ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ. බ්‍රිතාන්‍ය රූපවාහිනී නාලිකාවක් මගින් කරන ලද 'මර්ඩොක් කැමරොන් සහ බිලියන 08 ක ගනුදෙනුව' යන වාර්තාමය වැඩසටහනේ දී ලිබරල් ඩිමොක්‍රටිනක් පක්ෂයේ ප්‍රකාශක, ඔක්ෂොට් සාමිවරයා කියා සිටියේ ලෙව්සන් නඩුවේ දී හෙළිවූ කරුණුවලට අනුව ආත්ම ගරුත්වයක් ඇති කිසිම ඇමතිවරයෙකුට' තවදුරටත් කටයුතු කළ නොහැකි බවයි. මෙම සිද්ධියෙන් අනතුරුව 2011 ජූලි මස 14 දින මර්ඩොක් සමාගම 'ද බ්‍රිටිෂ් ස්කයි බ්‍රෝඩ්කාස්ටින්' ලංසුව අත්හරින ලද අතර එය තවමත් එසේම පවතියි.

තවද මතභේදයට ලක්වුණු පත්කිරීමක් වූ 'නිවුස් ඔෆ් ද වර්ල්ඩ්' හිටපු කර්තෘ, ඇන්ඩි කුල්සන් ඔහුගේ පුද්ගලික මාධ්‍ය ප්‍රධානියා ලෙස පත් කිරීම පිළිබඳව නැගූ ප්‍රශ්නවලට කැමරොන් ලබා දුන් පිළිතුරු ඉතාමත් වංචාකාරී ඒවා විය. ඇන්ඩි කුල්සන් අසත්‍ය සාක්ෂි දීමේ වරදට අත්අඩංගුවට පත් වූ අතර ඇප මත නිදහස ලැබීය.

ප්‍රශ්න කිරීම් අතරවාරයේ දී අගමැතිවරයා පැවසුවේ 'අප මෙහි සිටින්නේ සැබවින්ම සිදු වූ භයානක සිද්ධීන් කිහිපයක් නිසයි. ඒ මොහොත සත්‍යවශයෙන්ම සියල්ල වැමැරූ මොහොතයි. අපට දැකගත හැකි වූයේ දේශපාලකයින් සහ ජනමාධ්‍යවේදීන් අතර පවතින සමීප සබඳතාවය මෙවැනි අන්තරායකර අවස්ථාවන් කරා යා හැකි බවත් එමගින් මහජනයාට සිදුවන හානියත්ය. පැය විසිහතර පුරා සිදු කරන ප්‍රවෘත්ති විකාශ මගින් පැයෙන් පැය විවිධාකාර දේ ජනතාවට ලබා දෙයි. මෙය ඉතාමත් නිශ්ඵල දෙයක්. හැමවිටම ප්‍රති උත්තර දිය යුතුයි. දේශපාලකයින් මෙම චක්‍රයෙන් ඉවත්විය යුතුයි' .

පස් වසරකට පසු මර්ඩොක් 'ඔරලෝසු බට්ටා' සම්පූර්ණයෙන්ම විරුද්ධ දිශාවට දෝලනය වී ඇත. ලෙව්සන් කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් ජෝන් මේජර් තව දුරටත් මර්ඩොක් රහස් හෙළිකරමින් කියා සිටියේ ඔහු සහ ඔහුගේ බිරිඳ මර්ඩොක් සහ ඔහුගේ පවුලේ අයත් සමග 1977 මැතිවරණයට මාස තුනකට පමණ පෙර රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වූ බවයි. එහිදී මර්ඩොක් අගමැතිවරයාට පවසා ඇත්තේ ඔහුගේ රජයේ යුරෝපීය ප්‍රතිපත්තිය වෙනස් නොකළහොත් ඔහු කොන්සර්වේටිව් පක්ෂයට දෙන සහයෝගය නවතා දමන බවයි. ඉන්පසු ජෝන් මේජර් පැවසුවේ අතීතයේ සිදු වූ දේවල්ය. කොන්සර්වේටිව් පක්ෂය කම්කරු (ලේබර්) පක්ෂයට පැරදුණි. තමා මර්ඩොක් කියූ පරිදි යුරෝපීය සංගමයෙන් ඉවත්වීම ප්‍රත්ක්ශේප කළ බව මේජර් පැවසුවේය. ලෙව්සන් නඩු විභාගයේ දී ඔහු ප්‍රකාශ කළේ අගමැතිවරයා මාධ්‍ය සතුටු කිරීමට කටයුතු කළ යුතු යයි තමන් නොසිතන බවයි. නමුත් මර්ඩොක් දිවුරා ප්‍රකාශ කර සිටියේ අගමැතිවරයාට දුන් සහයෝගය වෙනුවෙන් කිසිවක් ඔහුගෙන් ඉල්ලා නැති බවයි.

ජෝන් මේජර් මෙන්ම හිටපු කම්කරු (ලේබර්) පක්ෂ අගමැති ගෝඩන් බ්‍රවුන් ද ලෙව්සන් නඩු විභාගයේ දී ප්‍රකාශකර සිටියේ තමන්ට සහයෝගය දීම 'නිවුස් ඉන්ටර්නැෂනල්' ප්‍රතික්ශේප කිරීමෙන් පසු එහි ප්‍රකාශනවලට එරෙහිව සටනක් දියත් කරන බවට මර්ඩොක්ට දුරකථන මාර්ගයෙන් තර්ජනය නොකළ බවයි. මර්ඩොක් සාක්ෂි දෙනවිට බ්‍රවුන් එසේ කළ බවට චෝදනා එල්ල කළේය. තවද රෙබෙකා බෘක් පවසා ඇති ආකාරයට තමාත් තම බිරිඳත් ඔවුන්ගේ රෝගී පුත් (සිස්ටික් ෆයිබ්‍රෝසිස් රෝගයෙන් පෙළෙන) ෆ්‍රේසර්ගේ සෞඛ්‍ය තත්ත්වය 'සන්' මුල් පිටුවේ පළ කිරීමට කැමැත්ත දුන්නා යන්න ඉතා හැගීම්බරව බ්‍රවුන් ප්‍රතික්ශේප කළේය. 'මේ පොළොව මත සිටින කිසිම දෙමව්පියෙකුට එවැනි දෙයක් කළ නොහැකිය' හැගීම්බර බ්‍රවුන් විනිශ්චයකාර ලෙව්සන්ට කියා සිටියේය.

විරුද්ධ පක්ෂයේ කම්කරු පක්ෂ නායක එඩ් මිලිබෑන්ඩ් මේ සතියේ සාක්කි දෙමින්, පොදුවේ දේශපාලකයින්ට මුහුණපාන්නට සිදුවන ව්‍යාකූලතාවයන් සංක්ෂිප්තව පෙන්වා දුන්නේය. දුරකථනවලට අනවසරයෙන් සවන් දීමට හෝ වෙනත් වැරදි ක්‍රියාවල යෙදීමට දේශපාලකයින් ඉතා මන්දගාමී බව ඔහු කීවේය. නොවළහා කතා කිරීමේදී බිය කනගාටුව හා සංකාව මුසු හැගීමක් ඇතිවේ. 'මම අදහස් ප්‍රකාශ කිරීමේ දී ඉතාමත් මන්දගාමියි නමුත් කෙසේ වෙතත් අවසානයේ දී මම රෙබෙකා බෘක් යායුතු යයි පැවසුවෙමි. 'නිවුස් ඉන්ටර්නැෂනල්' මෙය ඔවුන්ට එරෙහි යුද ප්‍රකාශයක් ලෙස දකින බව මම දැනසිටියෙමි. නමුත් ඇත්තවශයෙන්ම මම ජූලි මාසයේ කියූ දෙය කිවයුතුව තිබුණේ අප්‍රේල් මාසයේදියි'. මිලිබෑන්ඩ් ඉතා නිහතමානීව තම අදහස් ප්‍රකාශ කළ අතර එක අවස්ථාවකදී මර්ඩොක් හමුවී ඇති බවත් ඔහුත් සමග සාකච්ඡා කළේ ලෝක දේශපාලන තත්ත්වය පිළිබඳව මිස පවතින අපචාර චෝදනා ගැන නොවන බවත් ප්‍රකාශ කළේය.



Design & Layout by : Priyadharshini - *SLPI*